Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

### මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීම -2019

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නීති සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2019.06.28 වැනි දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

1.1 මෙම තනතුර සඳහා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා ලෙස වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් තීරණය කරනු ලැබේ.

1.2 මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම නිවේදනයේ ඡේද අංක 05 යටතේ සඳහන් ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(2) *සුදුසුකම් :*

2.1 අධ්‍යාපන සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිවේදී උපාධිය ලබා තිබීම; හෝ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

2.2 පළපුරුද්ද :
අදාළ නොවේ.එහෙත් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී පළපුරුද්ද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. (ලිඛිතව සනාථ කරන්න.)

2.3 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.4 වයස :
2.4.1. අවම සීමාව : අවුරුදු 21 ට නොඅඩු
2.4.2. උපරිම සීමාව :අවුරුදු 35 ට නොවැඩි

2.5 වෙනත් :
2.5.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
2.5.2 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
2.5.3 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.4 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන්වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(3) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය).
3.2 අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය.
3.3 තෝරාගනු ලබන අපේක්ෂකයින් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතුය.
3.4 භාෂා ප්‍රවීණතාවය
3.4.1 *රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :*
ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට බඳවා ගත් නිළධාරියෙකු පරිවාස කාලය තුළ සිංහල හෝ දෙමළ භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතුය. එම ප්‍රවීණතා මට්ටම වන්නේ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත් වීම.

3.4.2 අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය :

| *ප්‍රවීණතාවය ලබාගත යුතු කාලසීමාව* | *ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම* | *භාෂා ප්‍රවීණතාවය* | |
|---|---|---|---|
| | | *සේවයට බඳවා ගත් භාෂා මාධ්‍යය* | *ප්‍රවීණතාව ලබා ගත යුතු රාජ්‍ය භාෂාව* |
| සේවයට බැඳී පළමු වසර පහ (05) ඇතුළත | රාජ්‍ය සේවා චක්‍රලේඛ අංක 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. | සිංහල | දෙමළ |
| | | දෙමළ | සිංහල |
| | | ඉංග්‍රීසි | උපඡේද අංක 3.4.1 යටතේ ප්‍රවීණතාව ලබාගත් රාජ්‍ය භාෂාව හැර අනෙක් රාජ්‍ය භාෂාව |

(4) *මාසික වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 හි MN 4- 2016 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු. 31,490-10x445-11 x 660-10 x 730-5 x 750- රු. 54,250/= මාසික වැටුප් පරිමාණයක් හිමිය. (එම වැටුප ගෙවනු ලබන්නේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 හි විධිවිධාන වලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

(5) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.
සංලක්ෂය :-

5.1 සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

5.2 අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් සමාන මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම පත්වීම් බලධරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල් වන මා විසින් තීරණය කරනු ලබන අතර එය අවසාන තීරණය වනු ඇත.

5.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් * | 20 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම් * | 15 | |
| පළපුරුද්ද * | 30 | |
| භාෂා හැකියාව * | 15 | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

*ඉහත සුදුසුකම් ලිඛිතව සනාථ කළ යුතුය.

(6) අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

6.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

6.2 සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

6.3 සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාවය සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

6.3.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත

6.3.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය

6.3.3 වලංගු රියදුරු බලපත්‍රය

(7) අයදුම් කිරීමේ ක්‍රමය :

7.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රයේ ශීර්ෂ අංකය 01 සිට 06 දක්වා පළමු පිටුවේද 07 සිට 09 දක්වා දෙවන පිටුවේද 10 සිට 11 දක්වා තෙවන පිටුවේ ද වන සේ සකස් කර තමාගේ අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක)

7.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ 2019.06.28 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙන විත් අතින් හෝ භාර දිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි"වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි නීති සහකාර තනතුර සඳහා වන බඳවා ගැනීම - 2019"යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිඳු

අයදුම්පතක් භාරගනු නොලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

7.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාර වරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 47,615/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

8) සාවද්‍ය තොරතුරු සැපයීම

අපේක්ෂකයෙකු තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු පිළිබඳව බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

- මෙම නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
අධ්‍යක්ෂ ජනරාල්.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව.
2019 මැයි මස 25 වැනි දින.

## ආදර්ශ අයදුම්පත්‍රය

*මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය*

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නීති සහකාර තනතුරට බඳවා ගැනීම

01. මුලකුරු සමග නම :————. (මයා/මිය/මෙනෙවිය )

සිංහලෙන් :————.

ඉංග්‍රීසියෙන් :————.

01.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :

සිංහලෙන් :————.

ඉංග්‍රීසියෙන් :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

04. ස්ත්‍රී / පුරුෂභාවය-: ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐

05. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

06. දුරකතන අංකය : ස්ථාවර :————. ජංගම :————.

07. *අධ්‍යාපන සුදුසුකම්* :

07.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :————.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

07.2 තනතුරට අදාළ සුදුසුකම් :

| *අදාළ සුදුසුකම්* | *සුදුසුකම ලැබූ ආයතනය* | *වලංගු දිනය* |
|---|---|---|
| | | |

07.3 *අමතර සුදුසුකම්* :

08. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? ඔව්/නැත

08.1 ඔව් නම් විස්තරය සඳහන් කරන්න :
..........................................................................................................
..........................................................................................................

09. තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් :

1. නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දුරකතන අංකය :————.

2. නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දුරකතන අංකය :————.

10. ***අයදුම්කරුගේ සහතිකය*** :

(*අ*) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වා සිටිමි.
(*ඇ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*** :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................. නැමැති අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................................... දින මා ඉදිරිපිට දී ඉහත 10 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)